විදුලි බිල අඩු කර ජනතාවට සහන ලබාදීමට නොහැකිද?



● ඉන්දික හේවාවිතාරණ

විදුලි බිල අධික ලෙස ඉහළ යාම නිසා මේ රටේ සමස්ත ජනතාවම දැඩි පීඩාවකට ලක්වෙමින් තිබේ. විදුලි නිෂ්පාදනය සඳහා අධික මුදලක් වැය වන බව සඳහන් කරමින් පසුගිය වසරේ අගෝස්තු මාසයේ සිට මේ වන විට අවස්ථා තුනකදී විදුලි ගාස්තු ඉහළ දැමීමට කටයුතු කළේය. එහිදී විදුලි බල මණ්ඩලයේ තර්කය වූයේ, ගල්අඟුරු හා ඉන්ධන මිල ලෝක වෙළෙඳ පොළ තුළ අධික ලෙස ඉහළ යාම නිසා, විදුලි නිෂ්පාදනය සඳහා වර්ෂයකට ආසන්න වශයෙන් රුපියල් බිලියන හත්සියයකට අධික මුදලක් වැය වන බවයි. එහෙත් අද වන විට සමස්ත විදුලි අවශ්‍යතාවයෙන් 80%කට ආසන්න විදුලිය ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන්නේ ජලය උපයෝගී කරගෙනය.

ජලය උපයෝගී කරගෙන විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන්නේ රුපියල් 05කට අඩු මුදලක් වන අතර, පාරිභෝගික ජනතාවට විදුලි ඒකකයක් අලෙවි කරනු ලබන්නේ රුපියල් 30 ඉක්ම වූ මුදලකටය. මේ අනුව මේ වසර තුළදී විදුලි නිෂ්පාදනය සඳහා වැය වන්නේ රුපියල් බිලියන පන්සිය හැත්තෑ අටකට ආසන්න මුදලක් බවට විද්වතුන් පෙන්වා දෙමින් සිටින අතර, ජනතාව විදුලි බිල ගෙවමින් සිටින්නේ විදුලි බල මණ්ඩලයට රුපියල් බිලියන හත්සිය දහයක මුදලක් උපයා දීම වෙනුවෙනි.

ජලය ගතහොත් මහජනතාවට අයත් දේපළක් වන අතර, විදුලි නිෂ්පාදනය සඳහා ජලය භාවිත කළත් ඒ වෙනුවෙන් ජනතාවට මුදලක් ලබාදීමට විදුලි බල මණ්ඩලය කටයුතු කරන්නේ නැත. මේ නිසා සිදුකළ යුතු වන්නේ විදුලි බිල අඩු කර, පොදු දේපළක් වන ජලය භාවිත කිරීමේ වාසිය ජනතාවට ලබාදීමය. සාමාන්‍යයෙන් වසරකට නව පාරිභෝගිකයන් 150,000ක් පමණ අලුතින් විදුලි සම්බන්ධතා ලබාගන්නා අතර, මේ අනුව මේ ...

... විදුලිය පරිභෝජනය කර මාසයක් ඉක්ම ගිය පසු විදුලි බිල ගෙවිය යුතු අතර, බහුතර පාරිභෝගිකයන් සංඛ්‍යාවක් නියමිත වේලාවට විදුලි බිල්පත් ගෙවනු ලබන බව විදුලි බල මණ්ඩලය සඳහන් කරයි. බිල්පත් නිකුත් කර මාසයක් ගත වූ පසු තවත් දින 10ක සහන කාලයක් ලබාදෙන බවත්, විදුලිය විසන්ධි කිරීම සිදුකරනු ලබන්නේ ඉන්පසුව බවද විදුලි බල මණ්ඩලය පෙන්වා දෙයි.

2016 වසරේ සිට 2023 වසර නොවැම්බර් මාසය දක්වා විදුලිය විසන්ධි කිරීම් / නැවත සම්බන්ධ කිරීම් පිළිබඳ දත්ත

වර්ෂය	මුළු පාරිභෝගිකයන් සංඛ්‍යාව	විදුලිය විසන්ධි කිරීම් / නැවත සම්බන්ධ කිරීම්	
		වාර්ෂිකව	මාසිකව
2016	5,964,194	364,133	30,344
2017	6,193,131	398,292	33,191
2018	6,354,281	520,083	43,340
2019	6,500,641	573,073	47,756
2020	6,636,266	210,380	17,532
2021	6,809,528	94,201	7,850
2022	6,936,735	247,250	20,604
2023	6,998,068	544,488	54,449

ලංකා විදුලි බල මණ්ඩලය හඳුන්වාදුන් ඊ බිල් (e-bill) පත් ක්‍රමවේදය අනුව රතු බිල්පත් නිකුත් කිරීම ක්‍රම ක්‍රමයෙන් අඩු කරමින් පවතින බවත්, ඒ වෙනුවට ඉතා ඉක්මනින් හිඟ මුදල් SMS මගින් පාරිභෝගිකයන් වෙත දැනුම් දෙන බවත් විදුලි බල මණ්ඩලය සඳහන් කරයි.

... විසන්ධි කිරීම් ස්ථාන එක්ලක්ෂ අනූතුන්දහස් නවසිය හතරක ප්‍රමාණයෙන් පහළොස් ලක්ෂ දෙසිය හැත්තෑපහක් නිවාස වන අතර, ව්‍යාපාරික ස්ථාන හතළිස් තුන්දහස් තුන්සිය දහනවයක් හා ආගමික ස්ථාන තුන්සිය දහයක් ඇතුළත්ව තිබේ.

... ලබාගැනීම් හා භාණ්ඩ මිලදී ගැනීම් අඩු කර තිබෙන අතර, ඒ හරහා කර්මාන්තකරුවන් තවත් වටයකින් පීඩාවට පත්ව ඇත. කෝවිඩ් සමයේදී රට ආර්ථික අර්බුදයකට ලක්වූ අතර, ඉන්පසුව විදුලි බිල ඉහළ දැමීම නිසා නැවතත් රට ආර්ථික අර්බුදයකට ...

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදයේ 17වන දිනය සඳහා වන විවාදය ඊයේ (11දා) පැවැත්වුණි. එහිදී ධීවර අමාත්‍යාංශයේ සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වුණු අතර, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් මෙලෙස අදහස් පළ කළහ.

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදය

16වැනි දිනය

● දිනේෂ් සමරකෝන්

ඩීසල්වලට 18%ක ටැක්ස් එකක් ගැහුවොත් අපේ ධීවර කර්මාන්ත සඳහටම ඉවරයි

... අපි වාරිමාර්ග හරියට පවත්වාගෙන යන්නේ නැති නිසා මේ තත්ත්වයට මුහුණ දෙනවා. මම අමාත්‍ය ධුරය දරන කාලයේ කැලණියේ නාවික හමුදාවේ 100ක් සහ ග්‍රාම ආරක්ෂක භටයන් 100ක් දාලා ඇළ මාර්ග සියල්ල ශුද්ධ කළා. ඒ අවධියේ ඒ ප්‍රදේශවල ජල ගැලීම් තිබුණේ නැහැ.

අද CARTOON

සේනා දළඹුවා ආයෙ ඇවිත්

... වගාවට ඇවිත් තියෙනවා. දැනට මගේ වගාවට ගොඩක් හානි කරල තියෙනවා. අපි දැනට අළු යොදල මර්දනය කරන්න උත්සාහ කරනවා. මූලික ...

... අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ. මේකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කඩිනම් වැඩපිළිවෙළක් කළයුතුව තිබෙනවා. මේ ගොවියෝ ගොඩක් මේ වගාව කරල තියෙන්නේ ණයට සල්ලි අරන්.

... පිළිබඳව වැඩි විස්තර ගන්න 1920 අංකයට කතා කරන්න කියලා. මෙයට අමතරව ප්‍රදේශය භාරව ඉන්න කෘෂිකර්ම උපදේශක මහතා දැනුම්වත් කරන්න. දිනපතාම තමන්ගේ වගාව නිරීක්ෂණය කරන්න කියලත් ගොවීන්ගෙන් ඉල්ලීමක් කරනවා."

පුහුණු සේවකයන් සඳහා එක්සත් රාජධානිය නව සංක්‍රමණික සැලසුම් හඳුන්වා දෙයි

- අසීමාන්තික සංක්‍රමණ වැළැක්වීම අරමුණයි

ඕස්ට්‍රේලියාවත් සංක්‍රමණ නීති දැඩි කරයි

එක්සත් රාජධානිය වෙත සංක්‍රමණයවීමට බලාපොරොත්තුව සිටින පුහුණු සේවකයන් සඳහා නව වීසා නීති සහ සංක්‍රමණික නීති සැලසුමක් හඳුන්වාදීමට එරට බලධාරීන් පසුගියදා කටයුතු යොදා තිබේ. විශේෂයෙන්ම එරට වෙත සිදුකරන විදෙස් සංක්‍රමණයවීම් අඩු කිරීම මෙම තීරණයට හේතුව වී තිබේ.

එක්සත් රාජධානියේ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ජේම්ස් ක්ලෙවර්ලි විසින් පසුගියදා එරට පාර්ලිමේන්තුව වෙත මෙම නව සංක්‍රමණික නීති සැලසුම් ඉදිරිපත් කළේය. වාර්තාවලට අනුව පසුගිය වසරේදී පමණක් මෙලෙස එක්සත් රාජධානිය වෙත සංක්‍රමණය වී ඇති සංඛ්‍යාව 745,000ක් පමණ වෙයි.

මෙම නව වීසා සැලසුම අංශ පහක් සඳහා වන සැලසුමක් ලෙස ඉදිරිපත් කර තිබේ. එහිදී සෞඛ්‍ය සහ සාත්තු සේවා වීසා, පුහුණු සේවක වීසා, පවුල් වීසා සහ ශිෂ්‍ය වීසා ලෙස වර්ග කෙරී ඇත. ඒ අනුව, මෙහිදී පුහුණු ...

හඳුන්වාදී ඇති නව වෙනස්කම් හේතුවෙන් දකුණු ආසියානු කලාපය ඇතුළු රටවල පිරිස් වෙත දැඩි බලපෑම් එල්ල වී ඇතැයි වාර්තා පවසයි.



... රැකියා වීසා සඳහා අයදුම් කරන්නන්ගේ උපරිම ආදායම වර්ෂයකට ස්ටර්ලිං පවුම් 38,700ක් (ආසන්න වශයෙන් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක්) බවට පත්විය යුතුව ඇත. අද වනවිට මෙය පවුම් 26,200ක් ලෙස සටහන්ව ඇත. මෙය පැයකට පවුම් 10.75ක් වැනි අගයකි.

මෙම වැටුප් මට්ටම ඉහළ දැමීම 47.7%ක ප්‍රතිශතයකින් ...

දෘශ්‍ය ආබාධය බාධාවක් කර නොගෙනම කඩ ඉම ජයගත් සිසුන්

● ජනූර් කිව්ලාන් - කුරුණෑගල

කුරුණෑගල, සඳගල විශේෂ පාසලේ 2022 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් තිදෙනාම උසස් ලෙස සමත් වී ඇති බව විදුහල්පති සුමිත් කුමාර මහතා පැවසීය. එම තිදෙනාම දෘෂ්‍යාබාධිත සිසුන් වන අතර, සුරේෂ් සංජය A8, B1ක්ද, කවිඳු චානක A3, B1, C5 ක්ද, මලිති ප්‍රාර්ථනා B1, C5, S2 ලෙස සමත් වී ඇති අතර, පාසල ආරම්භ කර වසර 54ක් තුළ හොඳම ප්‍රතිඵල ලබාගැනීම මගින් පාසලට ...

... ඇති ජාතික හා ජනප්‍රිය පාසල්වල දරුවන් දහස් ගණන් සාමාන්‍ය පෙළ අසමත් වන විට ...

... ආකාරයෙන් සමත් වීම ආඩම්බරයක් බවත්, මෙවැනි පාසල්වල දරුවන් කිසිම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයක මෙවැනි දරුවන් ගැන ...